## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ එහි මුදල් ප්‍රවාහ සත්‍ය සහ සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 1.2.1 අවධාරණය කළ යුතු කරුණ

බැංකුව ඉතා සීමිත තැන්පත්කරුවන් මත වැඩිපර යැපෙන බව සහ එය ඉහළ ද්‍රවශීලතා අවදානමක පවතින බව දැක්වෙන පසුගිය වර්ෂයේ 47.08% ත් සමඟ සැසඳීමේදී, 2012 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ගනුදෙනුකරුවන්ගේ මුළු තැන්පතු වලින් 47.29 % කට වැඩි ප්‍රමාණයක් තැන්පත්කරුවන් 20 දෙනෙකුට අයිතිව පවතී. එමනිසා මෙම තත්ත්වය බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අහිතකර ලෙස බලපෑමක් ඇති කළ හැකි බව නිරීක්ෂණය විය.

### 1.2.2 ශ ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 "සේවක ප්‍රතිලාභ" ප්‍රමිතයේ නියමයන්ට අනුව, 2012 දෙසැම්බර් 31 දිනට බැංකුව විසින් සේවක පාර්තෝෂික ප්‍රතිපාදනයේ සාධාරණ අගය නිශ්චය කිරීම සඳහා ආයුගණක තක්සේරු වාර්තාවක් ලබා ගෙන නොතිබුණි.

(ආ) එසේම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 "සේවක ප්‍රතිලාභ" ප්‍රමිතයේ නියමයන්ට අනුව, බැංකුව විසින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යටතේ වගකීම් නිදහස් කිරීම සඳහා සැලසුම්ගත වත්කම් පවත්වාගත යුතු වුවත්, එසේ සදුකර නොතිබුණි. ( අරමුදලක් හෝ සුදුසුකම්ලත් රක්ෂණ ක්‍රමයක් යටතේ)

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

දේපළ උකස් මත නිවාස ව්‍යාපෘති වෙනුවෙන් ලබාදී තිබ අක්‍රමික ලෙස වර්ගීකරණය කරන ලද ණයකට අදාල දේපළ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වෙන්දේසි කිරීමට තීරණය කර තිබියදීත්, බැංකුව විසින් මෙම වර්ෂයේදී එම දේපළ සඳහා සාධාරණ අගය ආකෘතිය අනුව අනාගත මුදල් ප්‍රවාහයන් හඳුනා ගෙන ගිණුම් ගතකර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ණය අංකය | ලබාදී තිබූ ණය මුදල<br>රු. | අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ<br>දිනය |
|---|---|---|
| P020000001 | 10,000,000 | 2012/06/08 |

### 1.2.4 නොසැසඳු වෙනස්කම්

2012 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමුල්‍ය ණය ශේෂයන් සම්බන්ධයෙන්, පොදු ලෙජර ශේෂය සහ තුන්වන පාර්ශවයන්ගෙන් ලබාගත් ශේෂ සනාථන ශේෂයන් අතර පහත සඳහන් වෙනස්කම් හඳුනා ගෙන තිබුණි.

| විස්තරය | පොදු ලෙජරය අනුව ශේෂය<br>රු. | තුන්වන පාර්ශවයේ ශේෂ සනාථනය අනුව ශේෂය<br>රු. | වෙනස<br>රු. |
|---|---|---|---|
| ඇමරිකානු රජයේ ආධාර (යු එස් එයිඩ්) | 26,986,311 | 22,517,903 | 4,468,408 |
| ආසියානු සංවර්ධන බැංකුව II (ඒ ඩී බී II) | 85,676,993 | 44,965,266 | 40,711,727 |
| නිවාස මුල්‍ය පහසුකම් යෝජනා ක්‍රමය (ඒ එච් එෆ) | 739,848,788 | 739,809,088 | 39,700 |

### 1.2.5 හඳුනා නොගත් තැන්පතු

2012 දෙසැම්බර් 31 දිනට පොදු ලෙජරයට අනුව හඳුනා නොගත් තැන්පතු වල වටිනාකම රු. 3,181,292 ක් වූ අතර එයින් 99.5% ක් වසර 02 වඩා වැඩි විය. විස්තර පහත දැක්වේ.

| කාලය<br>(වර්ෂ) | සංඛ්‍යාව | වටිනාකම<br>රු. | ප්‍රතිශතය |
|---|---|---|---|
| 01-02 | 4 | 15,965 | 0.50 |
| 02-05 | 115 | 335,920 | 10.56 |
| 05-10 | 1023 | 2,104,838 | 66.16 |
| අවුරුදු 10 වැඩි | 319 | 724,568 | 22.78 |
| **එකතුව** | **1461** | **3,181,291** | **100** |

### 1.2.6 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

අක්‍රමික ණය ආදායම ලෙස වර්ග කර තිබූ ණය වලට අදාළ පොලී ආදායම ගිණුම් ගත කිරීමේදී, එය මුදල් පදනමක් මත එකතු කරන්නේ නම්, බැංකුව මගින් මුදල් එකතු කර ගන්නා අවස්ථාවේදී, ගිණුම් ගත කිරීම සිදු කල යුතුය. තවද, බැංකු පනතේ, 2008 අංක 04 දරන විධිවිධානයේ 5(1) අනුව, කල්පසු වූ සේවක අර්ථසාධක ණය සඳහා අයකල දඩ පොලී ආදායමද මුදල් පදනමට ගිණුම් කලයුතු බව දක්වා තිබියදත්, ඒ වෙනුවට උපචිත පදනම අනුගමනය කිරීමට බැංකුව කටයුතු කර තිබුණි.

### 1.2.7 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) සේවක ප්‍රසාද දීමනා**

බැංකුව විසින් මෙම වර්ෂය තුලදී සේවකයන් සඳහා සේවක ප්‍රසාද දීමනා ගෙවා නොතිබුණි. ඒ වෙනුවට, බැංකුව විසින් 2012 දෙසැම්බර් 04 දිනැති අංක එස්සිඑල්/2012/16 දරන චක්‍රලේඛය අනුව, විශේෂ සේවක ණය පහසුකමක් මත රු. 22,201,113 ක් වියදම් කර තිබුණ අතර, රු.19,748,946 කට ඇස්තමේන්තු කළ හැකි වන සමාලෝචිත වර්ෂයේ අලාභය වැඩිවීම වැලැක්වීම සඳහා, එම මුදල "විශේෂ සේවක ණය" යටතේ වත්කමක් වශයෙන් ගිණුම් ගත කර තිබුණි. එසේම, කළමනාකරණය විසින් මෙම ණය සඳහා පොලී අයකිරීමකින් තොරව මාස හයක සහන කාලයක්ද ලබාදීමට කටයුතු කර තිබුණි. තවද, බැංකුව විසින් අඩු ලාභදායි තත්ත්වයක් තුල කාර්යක්ෂම ලෙස අරමුදල් උපයෝජනය කර නොතිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

**(ආ) ආයෝජන දේපළ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 40 "ආයෝජන දේපළ" ප්‍රමිතයේ ඡේද අංක 33 අනුව, ආයතනයක් ආයෝජන දේපළ සාධාරණ අගය ආකෘතිය මත අගය කරන්නේ නම්, ආයෝජන දේපළ සියල්ලම සාධාරණ අගයට තක්සේරු කල යුතුය. ඒ අනුව, බැංකුව විසින් රු. 53,081,000 ක ප්‍රත්‍යාගණන අතිරික්තයක් සහිතව එක් ඉඩමක් රු. 207,000,000 කට තක්සේරු කර තිබුණි. කෙසේවෙතත්, තවත් ආයෝජන දේපළ තුනක් සාධාරණ අගය මත තක්සේරු කර නොතිබුණි.

(ii) ආයෝජන දේපළ ලෙස වර්ග කළ අවිස්සාවේල්ල නිවාස ව්‍යාපෘතියේ අගය රු. 179,310,709 ක් ලෙස 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ තුළ දක්වා තිබුණි. කෙසේවෙතත්, 2011 දෙසැම්බර් 31 දිනට සිදුකර තිබූ තක්සේරු වාර්තාව අනුව, තක්සේරු වටිනාකම රු. 175,211,200 ක් පමණක් විය. එමනිසා මූල්‍ය ප්‍රකාශ තුළ දක්වා තිබූ අගයෙ නිවැරදිතාවය පිලිබඳව සැක මතු කරයි.

(iii) රු. 5,630,000 කට විකුණා තිබූ අවිස්සාවේල්ල නිවාස ව්‍යාපෘතියේ නිවාස තුනක් සම්බන්ධයෙන් එකතු කල අගය මත බදු මුදල වන රු. 498,429 ගැණුම්කරුගෙන් අයකර ගැනිම වෙනුවට, බැංකුව විසින් ගෙවා තිබුණි.

**(ඇ) විශේෂ පාර්තෝෂිකය**

සාමුහික ගිවිසුම අනුව සේවා කාලය වසර 15 හෝ ඊට වැඩි කාලයක් සම්පූර්ණ කළ සේවකයන් සඳහා සාමාන්‍ය පාර්තෝෂිකයට අමතරව, විශේෂ පාර්තෝෂිකයක් බැංකුව විසින් 2007 වර්ෂයේ සිට ලබාදී තිබුණි. බැංකුව විසින් 2007 වසරේ සිට විශේෂ පාර්තෝෂික සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් සිදුකර නොතිබූ අතර මෙම වසර දක්වා අදාල ගෙවීම් මුදල් පදනම මත සදු කර තිබුණි. 2011 ජුනි 09 වන දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව, විශේෂ පාර්තෝෂිකය සඳහා ප්‍රතිපාදන සැලසීමේ අවශ්‍යතාව කළමනාකරණය විසින් හඳුනාගෙන තිබූ නමුත්, එයින් බැංකුවේ ලාභදායීත්වයට ප්‍රමාණාත්මක බලපෑමක් සිදු වන නිසා ප්‍රතිපාදනය සිදුකිරීමෙන් වැලකී තිබුණි.

(ඈ) අකීය ණය යටතේ වර්ග කරන ලද වංචනික ලියකියවිලි ඉදිරිපත් කර ලබා ගෙන තිබූ රු. මිලියන 1.8 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුල කපා හැර තිබුණි. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ සහකාර නිළධාරිණියක විසින් රු 1.00 ක් ඇයට අයිති මුදලින් තැන්පත් කර එම ණය ගිණුම වසා තිබූ බව නිරීක්ෂණය විය. බැංකුවේ සභාපතිනියට අනුව, මේ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදුකෙරෙමින් පැවතුණ.

(ඉ) බැංකුව විසින් පුද්ගලික ආයතනයක් මගින් සේවක කොටස් නිකුතු සැලැස්මක් යටතේ සත්‍ය වශයෙන් කොටස් නිකුත් කිරීමක් සිදු නොකොට, කොටස් ප්‍රාග්ධනය සහ අනෙකුත් වත්කම් රු. 49,842,936 ක් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි. එය අනෙකුත් වත්කම් ලෙස පුද්ගලික ආයතනයක් නමින් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සාමාන්‍ය පොලී අනුපාතයට පටහැනිව, ලංකා විදුලි බල මණ්ඩලයෙහි ස්ථාවර තැන්පතුව වු රු. මිලියන 450 ක් සඳහා වාර්ෂික පොලී අනුපාතය 22.1% ක් ගෙවීමට බැංකුව එකගවී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කල්පිරීමේ දිනයට වැඩිපුර ගෙවන ලද පොලිය රු. 69,391,353 ක් විය. මෙම තත්ත්වය ලිපිකාරමය දෝෂයක් නිසා ඇතිවී තිබූ බව සහ මෙහි නිවැරදි තත්ත්වය නොදැන අධ්‍යක්ෂ මණ්ඩලයද, මෙය අනුමත කර තිබූ බවත් බැංකුව විසින් ප්‍රකාශ කරන ලදී.

### 1.2.8 තොග සත්‍යාපනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට පොදු ලෙජරයේ තොග ශේෂය සහ භෞතික තොග සත්‍යාපන ශේෂය අතර රු. 7,576,128 ක වෙනසක් හඳුනා ගන්නා ලදී. මෙම වෙනස හඳුනා ගැනීමෙන් තොරව මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය වියදම් ලෙස ආදායමට එරෙහිව කපා හැර තිබුණි.

(ආ) තොග සැසඳුම් ප්‍රකාශනය අනුව, හඳුනා නොගත් රු. 1,533,284 ක් වටිනා තොග, මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය වියදම් ගිණුමට, හඳුනා ගැනීමෙන් තොරව බැර කර තිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට තොග වෙනසට හේතුවක් වූ ත්‍යාග භාණ්ඩ සඳහා ගෙවූ නොපියවන ලද, රු. 1,065,150 ක අත්තිකාරම් මුදල අදාළ ණයහිමි ගිණුමට බැර කිරීමකින් තොරව මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය වියදම් ගිණුමට බැර කර තිබු නිසා එහි ප්‍රතිඵලයක් ලෙස එම අගයට සමාන ප්‍රමාණයකින් ලාභය වැඩියෙන් පෙන්නුම් කෙරුණි.

### 1.2.9 ණය සහ අත්තිකාරම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අක්‍රමික ණය තත්ත්වය**

බැංකුවේ අක්‍රමික ණය අනුපාතය 20.20% ක් ලෙස 2012 දෙසැම්බර් 31 දිනට වාර්තා කර තිබු නමුත් බැංකු කෂේත්‍රය තුළ සාමාන්‍ය අක්‍රමික ණය අනුපාතය 6% කට වඩා අඩු විය.

**(ආ) සේවක අර්ථ සාධක වලට එරෙහිව ණය**

ගෙවීම් ලබාගැනිම සඳහා මහ බැංකුවට ඉදිරිපත් කර තිබු අක්‍රමික සේවක අර්ථ සාධක ණය 92 ක් සඳහා රු. මිලියන 4.2 ක් විවිධ හේතුන් මත ප්‍රතික්ෂේප කර තිබු බව 2012 මාර්තු 20 වන දින මහ බැංකුව විසින් දැනුම්දී තිබුණි. කෙසේවෙතත්, බැංකුව විසින් එම ණය මහ බැංකුවට නැවත යොමු කර ගෙවීම් ලබා ගැනිම සඳහා අවශ්‍ය කරන ක්‍රියාමාර්ග 2013 ජනවාරි 31 දින වන විටත් ගෙන නොතිබු අතර මෙම හිග ණය සඳහා ප්‍රවර්තන වර්ෂය තුළදී ප්‍රතිපාදන සිදු කර නොතිබුණි.

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී බැංකුවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 2.5 ක බදු පසු ශුද්ධ ලාභයකි. පෙර වර්ෂය තුළදී බැංකුවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 216 ක බදු පසු ශුද්ධ ලාභයක් වූ අතර ඒ අනුව පෙර වර්ෂය සමග සසඳා බලනවිට රු. මිලියන 213.5 කින් හෝ 99 % කින් බදු පසු ශුද්ධ ලාභය පහල ගොස් තිබුණ. 2012 වර්ෂයේ සංශෝධිත අයවැය අනුව, ඇස්තමේන්තුගත ශුද්ධ ලාභය රු. මිලියන 147 ක වූ අතර, ප්‍රවර්තන වර්ෂයේ තත්‍ය ශුද්ධ ලාභය සමඟ සසඳා බලනවිට, මෙම වසරේ ශුද්ධ ලාභය 98% කින් පහල ගොස් තිබූ බව නිරීක්ෂණය විය.

### 2.2 මෙහෙයුම් ප්‍රතිඵල වල සාරාංශය

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල, පෙර වර්ෂය සමග සන්සන්දනය පිළිබඳ සාරාංශයක් පහත වගුවෙහි දැක්වේ.

| | 2012 | 2011 |
|---|---|---|
| අයිතමය | | |
| | රු.'000 | රු.'000 |
| පොලී ආදායම | 2,634,758 | 2,260,966 |
| පොලී වියදම | (1,805,320) | (1,354,294) |
| ශුද්ධ පොලී ආදායම | 829,438 | 906,672 |
| පොලී නොවන ආදායම් | 58,458 | 83,664 |
| වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | (1,820) | 40,972 |
| මුළු මෙහෙයුම් ආදායම | 886,076 | 1,031,308 |
| සේවක පිරිවැය | (458,115) | (360,797) |
| වෙනත් වියදම් | (303,799) | (258,787) |
| ණය සඳහා හානිකරණය සහ අනෙකුත් පාඩු | (1,496) | (10,063) |
| එකතු කල අගය මත බදු වලට පෙර මෙහෙයුම් ලාභය | 122,666 | 401,661 |
| එකතු කල අගය මත බදු | (49,893) | (81,005) |
| බදු වියදම | (70,321) | (104,637) |
| වර්ෂය සඳහා ලාභය | 2,452 | 216,019 |

පෙර වර්ෂය සමග සැසඳීමේදී පොලී ආදායම සහ පොලී වියදම පිළිවෙලින් 17% කින් සහ 33% කින් ඉහළ ගොස තිබු අතර, පොලී නොවන වියදම් 21.24% කින්ද ඉහළ ගොස් තිබුණි. පෙර වර්ෂය සමග සැසඳීමේදී සේවක පිරිවැයද 27% කින් ඉහළ ගොස් තිබුණි.

## 2.3 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් වල පිරිවැය සහ ප්‍රතිලාභය

| විස්තරය | සමුච්චිත පිරිවැය සහ ආදායම් පදනම මත | | |
|---|---|---|---|
| | සාමාන්‍ය ශේෂය රු.'000 | පිරිවැය/ආදායම රු.'000 | අනුපාතය (%) |
| **තැන්පතු** | | | |
| ඉතුරුම් තැන්පතු | 1,585,683 | 89,705 | 5.66 |
| ස්ථාවර තැන්පතු | 7,794,636 | 1,107,473 | 14.21 |
| ධනනිධාන | 2,145,715 | 363,917 | 16.96 |
| අනෙකුත් තැන්පතු | 20,425 | 37 | 0.18 |
| **තැන්පතු වල උප එකතුව** | **11,546,458** | **1,561,131** | **13.52** |
| **ණය ගැනීම්** | | | |
| වාණිජමය ණය ගැනීම් | | | |
| බැංකු අයිරාව | 51,352 | 2,624 | 5.11 |
| වෙළඳ පොලින් ණය ගැනීම් | 816,448 | 137,233 | 16.81 |
| **වාණිජමය ණය ගැනීම් වල උප එකතුව** | **867,801** | **139,856** | **16.12** |
| **වෙනත් ණය ගැනීම්** | | | |
| විශේෂ ණය යෝජනා ක්‍රම | 1,053,931 | 39,483 | 3.75 |
| ප්‍රතිලේඛනගත ණය | 1,318,696 | 64,812 | 4.91 |
| වෙනත් ණය | 1,499 | 61 | 4.08 |
| **වෙනත් ණය ගැනීම් වල උප එකතුව** | **2,374,126** | **104,356** | **4.40** |
| අරමුදල් වල මුළු පිරිවැය | 14,788,385 | 1,805,344 | 12.21 |
| අනෙකුත් වගකීම් | 1,280,025 | - | - |
| ප්‍රාග්ධනය | 962,093 | - | - |
| සංචිත | 1,454,249 | - | - |
| | 18,484,753 | - | - |
| **අඩුකලා:** | | | |
| අනෙකුත් වත්කම් | 1,052,808 | - | - |
| මුල්‍යමය පිරිවැය | 17,431,945 | 1,805,344 | 10.36 |
| පොදු කාර්යය පිරිවැය | 17,431,945 | 768,298 | 4.41 |
| **අරමුදල් වල මුළු පිරිවැය** | 17,431,945 | 2,573,642 | 14.76 |
| ණය කළඹ | 14,846,850 | 2,278,680 | 15.35 |
| ආයෝජන | 2,585,095 | 356,737 | 13.80 |
| **මුල්‍යමය ප්‍රතිලාභ - කාර්යසාධනය** | 17,431,945 | 2,635,417 | 15.12 |

| | | | |
|---|---|---|---|
| ආන්තිකය | 17,431,945 | 61,775 | 0.35 |
| නිදහස පදනමට වෙනත් ආදායම් | 17,431,945 | 58,083 | 0.33 |
| **ආන්තිකය** | 17,431,945 | 119,858 | 0.69 |
| බදු | 17,431,945 | 85,787 | 0.49 |
| **ශුද්ධ ආන්තිකය** | **17,431,945** | **34,070** | **0.20** |

## 2.4 ප්‍රමාණාත්මක අනුපාත

සපයා තිබු තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ බැංකුවේ සමහර වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | 2012 % | 2011 % |
|---|---|---|
| **දර්ශකය** | | |
| **ලාභදායිත්වය** | | |
| (i) ශුද්ධ ලාභ අනුපාතය | 0.07 | 9.05 |
| (ii) ශුද්ධ පොලී ආදායම / පොලී ආදායම | 31.48 | 40.10 |
| (iii) පොලී ආදායමට පොලී පිරිවැය | 68.52 | 59.90 |
| (iv) ශුද්ධ පොලී ආදායමට පොදු කාර්ය වියදම් | 91.92 | 68.36 |
| (v) සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය | 0.01 | 1.22 |
| (vi) ස්කන්ධය මත ප්‍රතිලාභය | 0.10 | 10.32 |
| (vii) කොටසක ඉපැයුම (රු.) | 0.04 | 3.34 |
| **ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය** | | |
| (i) ස්කන්ධය : මුළු වත්කම් | 11.50 | 11.73 |
| (ii) ස්කන්ධය : ණය | 74.98 | 65.71 |
| (iii) පෙළ i | 20.79 | 21.34 |
| (iv) පෙළ ii | 21.46 | 21.95 |
| ද්‍රවශීලතා වත්කම් අනුපාතය | | |
| ද්‍රවශීලතා වත්කම් අනුපාතය ( අවමය 20 % ) | 22.65 | 21.15 |

## 2.5 බැංකු පරිණතවීම් විශ්ලේෂණය

බැංකුවෙහ වත්කම් වලට වඩා මුළු වගකීම් වැඩි බව, වත්කම් සහ වගකීම් මාසික මට්ටමෙන් විශ්ලේෂණය කිරීමේදී අනාවරණය විය.සමාලෝචිත වර්ෂයේ කෙටිකාලීන ද්‍රවශීලතා පරතරය මාස 03 ක් දක්වා සහ මාස 03 සිට 12 ත් දක්වා පිළිවෙලින් රු. මිලියන 5,095 සහ රු. මිලියන 4,142 ක් විය. විස්තර පහත දැක්වේ.

2012 දෙසැම්බර් 31 දිනට,

| | මාස 0-3 | මාස 3 -12 | වසර 1 -3 | වසර 3- 5 | වසර 5 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **වත්කම්** | | | | | | |
| මුදල් | 107.86 | - | - | - | - | 107.86 |
| බැංකු වලින් ලැබිය යුතු | 93.52 | - | - | - | - | 93.52 |
| ආයෝජන | 1,878.71 | 1,406.34 | 79.25 | 79.25 | 34.02 | 3,477.57 |
| ණය සහ අත්තිකාරම් | 853.97 | 1,121.45 | 3,464.18 | 3,024.57 | 7,501.50 | 15,965.67 |
| ස්ථාවර වත්කම් | - | - | - | - | 288.12 | 288.12 |
| අනෙකුත් වත්කම් | 24.78 | 60.67 | 9.60 | 6.62 | 766.20 | 867.87 |
| **මුළු වත්කම්** | **2,958.84** | **2,588.46** | **3,553.03** | **3,110.44** | **8,589.84** | **20,800.61** |
| | | | | | | |
| **වගකීම්** | | | | | | |
| මුළු ප්‍රාග්ධන අරමුදල | - | - | - | - | 2,391.21 | 2,391.21 |
| තැන්පතු | 6,296.29 | 5,887.24 | 209.73 | 88.78 | 440.87 | 12,922.91 |
| ණය ගැනීම් | 202.57 | 373.36 | 891.24 | 745.80 | 976.33 | 3,189.30 |
| අනෙකුත් වගකම් | 1,555.61 | 470.31 | 59.77 | 22.85 | 188.65 | 2,297.19 |
| **මුළු වගකීම්** | **8,054.47** | **6,730.91** | **1,160.74** | **857.43** | **3,997.06** | **20,800.61** |
| **පරිණතවීම් පරතරය** | **(5,095.63)** | **(4,142.45)** | **2,392.29** | **2,253.01** | **4,592.78** | **නැත** |

## 2.6 ව්‍යාපෘති ප්‍රමාදවීම

2012 වසරේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, බැංකුව විසින් මානව සම්පත් කළමනාකරණය සහ සේවක වැටුප් ගෙවීම් සඳහා පවතින යල්පැන ගිය මෘදුකාංග පැකේජය වෙනුවට අළුත් සුදුසු මෘදුකාංග පැකේජයක් මිලදී ගැනීමට බලාපොරොත්තු වී තිබුණි. ටෙන්ඩර් මණ්ඩලය විසින් මෘදුකාංගයක් මිලදී ගැනීම සඳහා පෞද්ගලික සමාගමක් නිර්දේශ කර තිබූ අතර 2012 ජුනි 14 දින 50% ක අත්තිකාරමක් ලෙස රු. 1,380,000 ක් ගෙවා තිබුණි. මෙම සමාගම සමග ඇති කර ගෙන තිබූ ගිවිසුම අනුව, මෙම වර්ෂය තුළදී ඉටුකර අවසන් කළයුතු ක්‍රියාකාරකම් 17 ක් විය. කෙසේවෙතත්, 2013 පෙබරවාරි 27 දිනැති තොරතුරු තාක්ෂණ කළමනාකාරතුමියගේ ලිපිය අනුව, සේවකයින්ගේ පැමිණිම වාර්තා කිරිම සහ සේවකයින්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වා ගැනම යන ක්‍රියාකාරකම් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

## 2.7 බැංකුවේ කාර්යසාධනය

**(අ) තැන්පතු**

2012 වර්ෂයේ සංශෝධිත අයවැය අනුව, මෙම වර්ෂය අවසානයේදී මුළු තැන්පතු රු. මිලියන 14,262 ක් දක්වා වැඩිවේ යැයි අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, මෙම දිනය වන විට සත්‍ය වශයෙන්ම එකතු වූ මුළු තැන්පතු ප්‍රමාණය රු. මිලියන 12,923 ක් විය.

**(ආ) ණය කළඹ**

2011 - 2013 සංයුක්ත සැලැස්ම අනුව, 2012 වර්ෂය අවසානයේදී රු. මිලියන 21,000 ක ණය ලබාදමට බැංකුව අපේක්ෂා කර තිබූ නමුත් 2012 වර්ෂයේ සංශෝධිත අයවැය අනුව, බලාපොරොත්තු වූ මුළු ණය වටිනාකම රු. මිලියන 17,364 ක් විය. කෙසේවෙතත්, මෙම වර්ෂය අවසානයේ ලබාදුන් සත්‍ය මුළු ණය වටිනාකම රු. මිලියන 15,966 ක් පමණක් විය.

**(ඇ) මූල්‍ය ආයෝජනය**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ආයෝජනය රු. මිලයන 2,288 ක් වූ අතර එම අගය පෙර වර්ෂයේදී රු. මිලියන 3,347 ක් වූ බැවින් ඒ සමඟ සංසන්දනය කිරීමේදී මෙම වසරේ රු. මිලියන 1,059 කින් හෝ 31.64% කන් ආයෝජන වල අගය පහළ ගොස් තිබුණ.

**(ඇ) ශාඛා කාර්යසාධනය**

රටපුරා ශාඛා 32 ක් පිහිටා තිබියදීත්, බැංකුව විසින් සාමාන්‍යයෙන් ශාඛා වශයෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. එමනිසා ශාඛා කාර්යසාධනය පිළිබඳ නිසි පරිදි පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 3. පද්ධති හා පාලන

විගණන සිදුකරන අතරතුර නිරීක්ෂණය වූ පද්ධති සහ පාලන දුර්වලතා පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (එ) වගන්තිය ප්‍රකාර මාගේ විස්තරාත්මක වාර්තාව මගින් බැංකුවේ සාමාන්‍යාධිකාරි වෙත පෙන්වා දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ඉන්වෙන්ට්‍රි හා ගබඩා කළමණාකරණය
(ආ) ණය පරිපාලනය
(ඇ) අත්පත් කරගත් දේපළ විකිණීම
(ඇ) නිවාඩු වාර්තා පවත්වා ගෙන යාම
(ඉ) ආයෝජන අරමුදල
(ඊ) ස්ථාවර තැන්පතු
(උ) මෘදුකාංග පැකේජයන්